www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මංමුලාසහගත උපාමාරු මගින් ශ්‍රී ලංකාණ්ඩුව තුනී බහුතරයක් සපයා ගනී

## Desperate manoeuvres give Sri Lankan government a thin majority

**කේ රත්නායක විසිනි**
**2007 පෙබරවාරි 01**

පසුගිය සතියේදී ශ්‍රී ලංකාවේ විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දුසිම් දෙකක් ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවට එක්වූහ. ප්‍රථම වරට පාර්ලිමේන්තුව තුල පැහැදිලි බහුතරයක් ලැබීමෙන් ආන්ඩුවේ අත ශක්තිමත් වූ වගක් මතු පිටින් පෙනෙන නමුදු යතාර්ථයේදී අපාලිත සන්ධානයෙන් හා දැවැන්ත කැබිනෙට්ටුවෙන් සලකුනු කෙරෙන්නේ දෙමල විමුක්ති කොටි සංවිධානයට එරෙහිව ගෙන යන මහජන අප්‍රසාදයටපත් යුද්ධය රාජපක්ෂ විසින් ඉහල නැංවීමත් සමග ඇතිව තිබෙන ගැඹුරු දේශපාලන අර්බුදයයි.

එක්සත් ජාතික පක්ෂයෙන් (එජාප) 18 ක් ද ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයෙන් (ශ්‍රීලමුකො) 6 ක් ද වශයෙන් මෙම "පිල් මාරුව" සිදු වූයේ සති ගනනාවක් පුරා තිරයෙන් පිටුපස සිදු කෙරුනු කේවල් කිරීම් වලින් පසුවයි. 10 දෙනෙකුට කැබිනට් ඇමැති ධූර ද ඉතිරි අයට කැබිනට් නොවන සහ නියෝජ්‍ය ඇමති ධූර ද වශයෙන් එජාපයේ 18 දෙනාටම ඇමැති පදවි ලැබින. ශ්‍රීලමුකො නායක රවුෆ් හකීම් කැබිනට් ඇමතිවරයෙකු ලෙස ද අවශේෂ සාමාජිකයන් නියෝජ්‍ය ඇමතිවරු වශයෙන් ද පත් කෙරුනි.

රටේ පාර්ලිමේන්තු ආසන 225 න් ආසන 113 ක් දැන් සන්ධාන ආන්ඩුව සතු වන අතර එය යන්තමින් එකක් වන පාර්ලිමේන්තු බහුතරයකි. මෙම සන්ධානය එකට බැඳ තබන අත්‍යවශ්‍ය අධි බන්ධනය වනාහි නිලතල වලින් ලැබෙන වාසි සහ වරප්‍රසාදයෝම වෙත්. පසුගිය ඉරිදා සිදුවූ ඇමති මන්ඩල සංශෝධනයෙන් පසු රාජපක්ෂ ජනාධිපතිකම් කරන්නේ ආසියාවේ විශාලතම කැබිනෙට්ටුව සහිත ආන්ඩුවේ වන අතර එහි මන්ත්‍රීවරු 104 කට ම තානාන්තර ඇත. ඔවුන්ගෙන් 52 ක් කැබිනට් ඇමතිවරු වන අතර 33 ක් කැබිනට් නොවන ඇමතිවරු ද 19 ක් නියෝජ්‍ය ඇමතිවරු ද වෙති.

2005 නොවැම්බර් ජනාධිපතිවරනයෙන් රාජපක්ෂ යන්තමින් ජය ගන්නා විට ඔහුගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය(ශ්‍රීලනිප) ට තිබුනේ ආසන 58 ක් පමනි. වෙනත් පක්ෂ පහක් සමග වූ ශ්‍රීලනිපයේ "එක්සත් සන්ධානය" ට තිබූ සමස්ත ආසන සංඛ්‍යාව 88 ක් වූ අතර එය බහුතරයට ඉතා අඩු අගයකි. රාජපක්ෂට පාර්ලිමේන්තුව තුල පරාජය වලක්වා ගැනීම සඳහා තමා විසින් මැතිවරන ගිවිසුම් වලට එළැඹ සිටි සිංහල අන්තවාදී පක්ෂ දෙකක් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය (ජාහෙඋ) මත යැපෙන්නට සිදුවිය.

එල්ටීටීඊයට එරෙහි ආක්‍රමනශීලී ආකල්පයකින් තම ආන්ඩුව මෙහෙයවමින් රාජපක්ෂ ජවිපෙ සහ ජාහෙඋ සමග ගනුදෙනු කරයි. මාස ගනනාවක් පුරා මිලිටරිය තම සගයින් වන අර්ධ මිලිටරි කන්ඩායම් සමග එක්ව එල්ටීටීඊය ප්‍රකෝප කිරීම සහ දෙමල මහ ජනතාව ත්‍රස්ත කිරීම අරමුනු කර ගනිමින් නීච අප්‍රකට ඝාතන යුද්ධයක් දියත් කලේය. ජූලි මාසයේ දී 2002 සටන් විරාමය විවෘතවම උල්ලංඝනය කරමින් ප්‍රහාරය සඳහා රාජපක්ෂ මිලිටරියට අන කලේය. මිලිටරය නැගෙනහිර පලාතේ මාවිල්ආරු, සාම්පූර් සහ ඉතා මෑතකදී වාහරේ ද අල්ලා ගති.

මේ සමගම යුද්ධයට සහ පහල වැටෙන ජීවන කොන්දේසි වලට එරෙහිව වැඩෙන මහජන මතය හමුවේ ආන්ඩුවේ පාර්ලිමේන්තු බලය වර්ධනය කර ගැනීම සඳහා රාජපක්ෂ මංමුලා සහගත ප්‍රයත්නයන්හි යෙදී ගති. පසුගිය අගෝස්තුවේදී රාජපක්ෂ ලංකා කම්කරු කොන්ග්‍රසය (සීඩබ්ලිව්සී) සහ කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) ආන්ඩුවට ඇදා ගත්තේය. සීඩබ්ලිව්සී සහ යූපීඑෆ් යනු දෙමල වතු කම්කරුවන්ගේ සහාය ලබමින් දේශපාලන පක්ෂ ලෙසද ක්‍රියාත්මකවන වෘත්තීය සමිති වෙති.

මෑතම "පිල් මාරු" ආන්ඩුවට තුනී බහුතරයක් ලබා දෙන නමුදු එමගින් යන්තම් තුන් මසකට පෙර එනම් ඔක්තෝබර් 23 දා ශ්‍රීලනිප සහ එජාප අතර අත්සන් තබන ලද ගිවිසුමක් බලගතු ලෙස අනතුරේ හෙලයි. ආකාරගත දේශපාලන සන්ධානයක් නොවුනද දිගු කාලීන එදිරිවාදීන්වන රටේ ප්‍රධාන ධනපති පක්ෂ දෙක ප්‍රථම වරට යුද්ධය ඇතුලු කරුනු කීපයක් මත එක්ව වැඩ කිරීමට ගිවිස ගත්හ. ප්‍රධාන කරුනු වලදී එජාපයේ

උපදෙස් ලබා ගන්නා බවට රාජපක්ෂ ශපථ වූ අතර වසර දෙකක් සඳහා ආන්ඩුවට උදව් කරන බවට එජාපය පොරොන්දු විය.

මෙම එජාප-ශ්‍රීලනිප ගිවිසුම වනාහි සාම සාකච්ඡා යලි ඇරඹුම සඳහා මග සලසන ප්‍රධාන ඉදිරි පිම්මක් බවට මාධ්‍යයන්, ව්‍යාපාරික ලොක්කන් සහ එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය ඇතුලු විදේශ බලයන් විසින් මහත් සේ වග වර්නනා කලහ. පොදු පෙරමුනකට පැමිනීම හේතුවෙන් පූර්න පරිමාන යුද්ධයක් ඉල්ලා සිටින ජවිපෙ මෙල්ල කිරීම සඳහා ආන්ඩුවට හැකිවන බවටත් රටේ දිග් ගැසුනු සිවිල් යුද්ධය නිමා කරනු වස් එල්ටීටීඊය සමග ගනුදෙනු කිරීමට ඉන් මග පෑදෙන බවටත් ඔවුහු තර්ක කලහ. පක්ෂ දෙක අතර සිදුවූ ගිවිසුමමත් යුද්ධයෙන් ජනිත කෙරුනු බලගතු දේශපාලන සහ ආර්ථික අර්බුදයකට රට මුහුන දී සිටින බැව් පිලි ගැනීමකි.

සිදුවූයේ යුද්ධය තව දුරටත් තීව්‍ර කරමින් ඉදිරියට ගෙන යාමයි. වැඩිවන බඩු මිල සහ පුලුල්ව පැතිරෙන දරිද්‍රතාව හමුවේ ගැඹුරුවන සමාජ අතෘප්තියට රාජපක්ෂ ප්‍රතිචාර දැක්වූයේ වාර්ගික භේදයන් ඇවිලවීමෙන් හා යුද උන්මාදයෙන් යුත් වාතාවරනයක් ජනිත කිරීමෙනි. ඔහුගේ ආන්ඩුව විසින් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර මාලාවක් ගනු ලැබූ අතර නඩු ඇසීමකින් තොරව දිගු කාලීනව සිර අඩස්සියේ රඳවා තැබීමට ඉඩ සලසන කුප්‍රකට ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත තවත් සවි ගන්වමින් බලාත්මක කෙරුනු එහි නව සංශෝධනයක්ද ඒවා අතර විය. ආන්ඩුවට විරුද්ධවනවා වෙනුවට ශ්‍රීලනිපය මෙන්ම හුදෙක් දෙමල විරෝධී ස්වෝත්තමවාදයටම ඇලුනු එජාපය කලේ ආන්ඩුවේ පිලිවෙත්වලට නිහඬව සහාය දැක්වීමයි.

"පිල් මාරු" මගින් තම ආන්ඩුව "ස්ථාවර" කරගත් රාජපක්ෂ යුද්ධය තව දුරටත් තීව්‍ර කරනු ඇත. ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසුගිය සිකුරාදා රොයිටර් පුවත් සේවයට මෙසේ ප්‍රකාශ කලේය: "උතුරේ, නැගෙනහිරේ හෝ දකුනේ කවර හෝ තැනක පවත්නා ඔවුනට (එල්ටීටීඊ) අයත් සියලු දෑ විනාශ කිරීම අපට නිසැකවම අවශ්‍යය....කවර හෝ තැනක තිබෙන ඔවුනට අයත් දෑ විනාශ කිරීමට අපට අවශ්‍යය...මක් නිසාදයත්, ඔවුනට මුහුදු කොටි කඳවුරු තිබෙනතාක්, ඔවුනට කාල තුවක්කු තිබෙනතාක්, හානි සිදුකල හැකි කවර හෝ තැනකට එසේ සිදු කිරීමට ඔවුන් සිතන බැවිනි."

සඳුදා පැවති ශ්‍රී ලංකාවට ආධාර දෙන්නන්ගේ සමුලුවේදී ජනාධිපති රාජපක්ෂ මීට සමාන පනිවිඩයක් දෙමින් මෙසේ පැවසීය: "ත්‍රස්තවාදය පරාජය කිරීමේදී අපේ අරමුන වන්නේ ත්‍රස්තවාදයේ ගොදුරු බවට පත්ව සිටින ජනතාව ඉන් මුදවා ගැනීමයි." මෙතෙක් පැවති සියලු ආන්ඩු විසින් රටේ දෙමල සුලුතරයට ක්‍රමානුකූලව කරන ලද කෙනහිලිකම් මත රඳා පවත්නා යුද්ධයේ සැබෑ මූලයන් මඩ කරනුවස් එල්ටීටීඊය "ත්‍රස්තවාදීන්" ලෙස නැවත නැවතත් හෙලා දකිනු ලැබේ. සියලු දෙනාම සාමය සඳහා කැඳවුම් කරන නමුදු සමුලුව තුල කිසිවෙක් හෝ 2002 සටන් විරාමය පැහැදිලිවම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රාජපක්ෂට හෝ ඔහුගේ ආන්ඩුවට අභියෝග නොකලහ.

ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාන්ඩුවේ ආක්‍රමනයට එක්සත් ජනපදය එහි සහාය පෙන්නුම් කලේය. කට වචනයට "සාමයේ" අවශ්‍යතාව ගැන කතා කරන අතරේම ඇමරිකානු තානාපති රොබර්ට් බ්ලේක් මෙසේ ප්‍රකාශ කලේය: "ශ්‍රී ලංකාව ත්‍රස්තයට එරෙහිව කරන සටනේ දී එල්ටීටීඊයට ආයුධ සහ මුදල් ගලා ඒම වැලැක්වීමෙන් ද නීති බල ගැන්වීමේ සහාය සම්පාදනය කිරීමෙන් ද ශ්‍රී ලංකාවේ මිලිටරියට තෙමේම ආරක්ෂාවීමට සහාය වනු වස් පුහුනුව සහ උපකරන සැපයීමෙන් ද අපි ශ්‍රී ලංකාවට සහාය දීමේ බලගතු ආධාරකරුවෙක් වන්නෙමු."

"පිල් මාරු" හේතුවෙන් එජාපය අර්බුදයට වැටින. පක්ෂ දෙක අතර ඇති කරගත් ගිවිසුම අනතුරේ වැටිය හැකැයි පවසමින් එජාප නායක රනිල් වික්‍රමසිංහ තම මන්ත්‍රීවරුන් ඇද ගැනීමට එරෙහිව ශ්‍රීලනිපයට මුලදී අනතුරු ඇගවීය. ඉරිදා පැවති මාධ්‍ය හමුවකදී පක්ෂ සභාපති රුක්මන් සේනානායක ගිවිසුමේ පිටපතක් ඉරා දැමූ අතර රටේ ප්‍රශ්න විසඳ ගැනීමට තිබූ අවස්ථාවක් රාජපක්ෂ විසින් නැති කරගත් බවට පක්ෂ මහ ලේකම් තිස්ස අත්තනායක අඳෝනා නැගීය. එජාප විසින් ආන්ඩුවට එරෙහිව උද්ඝෝෂනයක් දියත් කෙරෙන බවක් ඔහුගේ කතාවෙන් පෙන්නුම් කෙරින-මෙය ජවිපෙ සමග එක්ව කරන්නක් විය හැක.

ජවිපෙ ද ආන්ඩුවට තමා ලබා දෙන සහාය අවදානමේ ඇති බැව් පෙන්වමින් එජාප මන්ත්‍රීවරුන් කැබිනෙට්ටුවට වද්දා ගැනීම විවේචනය කලේය. 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාමය අත්සන් කිරීමෙන් රට පාවා දුන්නේ යැයි නිරතුරුව චෝදනා කල ජවිපෙ එජාපයට දැඩිසේ විරුද්ධය. ජවිපෙ නායකයකු වන අනුර කුමාර දිසානායක මෙම "පිල් මාරුවන්ගෙන්" තිදෙනෙකු වන, එල්ටීටීඊය සමග සාම කතා වලට පිටු බලය දුන්, ජී.එල්.පීරිස්, මිලින්ද මොරගොඩ සහ රාජිත සේනාරත්න සුවිශේෂිතව හෙලා දුටුවේ ඔවුන් "රටේ අවශ්‍යතා වලට එරෙහිව" ක්‍රියා කල බව පවසමිනි.

එජාප සමග ගිවිසුම අත්සන් කිරීමට පෙර විධිමත් සන්ධානයක් සඳහා රාජපක්ෂ ජවිපෙ සමග සාකච්ඡා කලේය. ගිවිසුමක් ඇති නොවූ නමුදු එල්ටීටීඊයට එරෙහි

යුද ප්‍රකාශ කිරීමකට හේතු වන කරුනු 20 ක වැඩ පිලිවෙලක් ජවිපෙන් ඉදිරිපත් කෙරින. මහජන සහ ජාත්‍යන්තර සහාය ලබා ගනු වස් එල්ටීටීඊය ආක්‍රමනිකයකු ලෙස පින්තාරු කරනා අතරේ තමා සාමයේ මිනිසකුසේ විදහා පෙන්වීමේ උපාමාරු දැමීමට රාජපක්ෂ වඩා කැමතිය. සඳුදා ජවිපෙ නිකුත් කල දේශපාලන කමිටු ප්‍රකාශයක් මගින් "ජන වරම දිය කර හැරීම සඳහා දරන උත්සාහයන් පරාජය කිරීමේ" ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක් පිලිබඳව ලකුනු පහල කෙරින. ජන වරම යනුවෙන් මොවුන් හඳුන්වනු ලබන්නේ යුද වැඩ පිලිවෙල ඇගවුම් කෙරුනු රාජපක්ෂගේ 2005 මැතිවරන ප්‍රකාශයයි.

බලය රඳවා ගනු වස් ආන්ඩුව දැමූ මෑතම උපාමාරු මගින් ප්‍රධාන පක්ෂවල පරිහානිගතභාවය මතු කර පෙන්වයි. මහ ජනතාවගේ ගැඹුරුවන සමාජ අර්බුදයට ආමන්ත්‍රනය කිරීමට මුලුමනින්ම අසමත් මෙම සියල්ලෝම රටේ පවත්නා ම්ලේච්ඡ යුද්ධයට විසඳුමක් ඔවුන් සතුව නොමැති තතු තුල කම්කරු ජනතාව භේද කිරීම සඳහා ස්වෝත්තමවාදය ඇවිලීම තම විකල්පය ලෙස තෝරා ගෙන සිටිති. අතිමහත් බහුතරයක් සමස්ත දේශපාලන සංස්ථාපිතයෙන්ම වියෝවී සිටින අතර ශ්‍රීලනිපයට හෝ එජාපයට කවර හෝ සැලකියයුතු ක්‍රියාකාරී ආධාරක පදනමක් නොමැත. පක්ෂ දෙකම අභ්‍යන්තර කාන්ඩමික ඇන කොටා ගැනීම් වලින් කුනුවී ඇති අතර කවර ආකාරයෙන් හෝ බලය දරා සිටීමේ සහ බලයේ එල්ලී ගැනීමේ ක්‍රියාවන්හි ව්‍යාවෘතව සිටිති.

තම ප්‍රතිගාමී පිලිවෙත් වලට මහජන සහාය ලබා ගැනීමට අසමත් රාජපක්ෂ චාටුවෙන් සහ අල්ලසෙන් ප්‍රමානවත් තරම් මන්ත්‍රීවරු සංඛ්‍යාවක් බා ගන්මින් එක් ආසනයක පාර්ලිමේන්තු බහුතරයක් ස්ථාපිත කර ගැනුමට සමත්ව සිටී. තරගකාරී සහ පරස්පර විරෝධී අවශ්‍යතාවන්ගෙන් වෙලුනු නිසගයෙන්ම අස්ථාවර මෙම සමස්ත දේශපාලනික දේහය අනිවාර්යයෙන්ම කල් පමා නොවී ඉක්මනින්ම කඩා වැටෙනු ඇත. අවශ්‍ය කෙරී පවත්නේ පාලක ප්‍රභූවේ සියලු පක්ෂ වලින් බිඳී වෙන්වීම හා යුද්ධය සහ සමාජ අසමානතාවය අවසන් කිරීම සඳහා සමාජවාදී ජාත්‍යන්තරවාදය මත පදනම්වූ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැංවීමයි.

© www.wsws.org